# කැලණිය විශ්වවිද්‍යාලය

## මානවශාස්ත්‍ර පීඨය

## පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

## බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය ඩිප්ලෝමා පාඨමාලාව 2026 වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම

- ✓ බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අපේක්ෂකයින් ලියාපදිංචි කිරීම පිණිස 2025-09-20 වන දින සිට 2025 - 12 - 08 වන දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.
- ✓ පාඨමාලාව සඳහා **බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණය (Interview) 2025/12/14** වන **ඉරිදා** දින **උදෑසන 09.00 සිට සවස 04.00 දක්වා** කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ දී සිදුකෙරේ.
- ✓ පහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති ඉල්ලුම්කරුවන් එදින සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන්න.
- ✓ එදින රැගෙන පැමිණිය යුතු ලිපි ලේඛන - 01. ජාතික හැඳුනුම්පත 02. අධ්‍යාපන සුදුසුකම්වල මුල් සහතික හා ඡායා පිටපත්.

### පාඨමාලාවේ පසුබිම

මෙම පාඨමාලාව **බෞද්ධ මනෝවිද්‍යාව, බෞද්ධ මනෝ උපදේශනය හා බෞද්ධ මනෝචිකිත්සාව** පිළිබඳ පූර්ණ අවබෝධයක් හා පුහුණුවක් ලබාදීමේ අරමුණින් මෙරට ප්‍රමුඛ පෙළේ ජාතික විශ්වවිද්‍යාලයක් වන කැලණිය විශ්වවිද්‍යාලයේ, මානව ශාස්ත්‍ර පීඨයට අයත් පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය මගින් කාලීන සමාජ සත්කාරයක් ලෙස පවත්වනු ලබන සුවිශේෂී ඩිප්ලෝමා පාඨමාලාවකි. වර්තමානය වන විට බෞද්ධ මනෝවිද්‍යාව හා බෞද්ධ මනෝ උපදේශනය පිළිබඳ අධ්‍යයනය සඳහා පෙර-අපර දෙදිගම විද්වතුන් තුළ දැඩි උද්‍යෝගයක් දැකගත හැකිය. එසේ ම ඒ පිළිබඳ විශිෂ්ට මට්ටමේ පර්යේෂණයන් ද සිදුකෙරෙන අයුරු දැකිය හැකිය.

### මෙම පාඨමාලාව කවුරුන් සඳහාද?

ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලයක් වශයෙන් කැලණිය විශ්වවිද්‍යාලය අභ්‍යන්තර සිසුන් වෙනුවෙන් 2017 වසරේ සිට උපාධි පාඨමාලා සඳහා බෞද්ධ මනෝවිද්‍යාව විෂය හඳුන්වා දෙන ලද අතර, මෙම පාඨමාලාව **රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනවල සේවයේ නියුතු උපදේශකවරුන්, භික්ෂූන් වහන්සේලා ඇතුළු කිසියම් ආගමකට අයත් පූජ්‍ය පක්ෂය සහ අනෙකුත් ආගමික බැතිමතුන්, වෛද්‍යවරුන්, සෞඛ්‍ය හෙද-හෙදියන්, ඉන්ජිනේරුවරුන්, විදුහල්පතිවරුන්, දේශපාලකයින්, ගුරුවරුන්, ව්‍යාපාරිකයින්, කලාකරුවන්, ආයතන කළමනාකරුවන්, ආයතන සේවකයින්, ආයතන පරිපාලකවරුන්, විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන්, ගෘහණියන් සහ විශ්‍රාමික ගුරුවරුන්, රාජ්‍ය සේවකයන් ඇතුළු මානසික සෞඛ්‍ය පිළිබඳ උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට** සුදුසු පාඨමාලාවකි.

මේ වන විට එහි හත්වන කණ්ඩායම (07) ඉතා සාර්ථකව සිය පාඨමාලා අවසන් කරමින් ඇති අතර, **2026 ජනවාරි මාසයේ සිට එහි අටවන (08)** කණ්ඩායමේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

**පාඨමාලා කාලය** - මාස 12 කි. **මාධ්‍යය** - සිංහල

**පාඨමාලා ගාස්තු** - පාඨමාලා ගාස්තුව රු. 55000 කි. වාරික තුනකින් ගෙවිය හැකිය.

පළමු වාරිකය රු. 20000

දෙවන වාරිකය රු. 20000

තුන්වන වාරිකය රු. 15000

සහතිකය ඔබ අතට පත්වීම දක්වා ඔබගේ සම්පූර්ණ ආයෝජනය රු. 55000 කි. (මෙම මුදල හැර සහතික පත්‍ර ප්‍රදානය දක්වා වෙනත් කිසිඳු අමතර මුදලක් අය නොකෙරේ.)

## අයදුම් කිරීම සඳහා පහත සුදුසුකම් අතරින් එකක් පමණක් ප්‍රමාණවත් ය.

- අ.පො.ස (උ/පෙළ) විෂයයන් 3 කින් සමත් වීම.
- ප්‍රාචීන ප්‍රාරම්භ, මධ්‍යම සහ අවසාන විභාගවලින් එකක් හෝ සමත් වීම.
- ඩිප්ලෝමා සමතුන් (රජයේ ලියාපදිංචි ආයතනයක් වියයුතුය).
- ධර්මාචාර්ය විභාග පරීක්ෂණය සමත් වී තිබීම.
- අ.පො.ස. (සා/පෙළ) සමග දහම්පාසල් අවසාන විභාගය සමත්වීම.
- අ.පො.ස. (සා/පෙළ) සමග වසර පහක රාජ්‍ය සේවයේ කටයුතු කළ බව තහවුරු කිරීමේ සේවා සහතිකය.
- ශාස්ත්‍රවේදී හෝ ගෞරව ශාස්ත්‍රවේදී උපාධියක් හෝ පශ්චාත් උපාධි සම්පූර්ණ කරතිබීම.
- කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන සුදුසුකම් සැලකිල්ලට ගැනේ.

## අයදුම්පත්‍රය ලබාගත හැකි ආකාරය -

- https://hu.kln.ac.lk/depts/pali/ යන වෙබ් අඩවියෙන් හෝ
- **0742939904 (පාඨමාලා සහායක)** දරන **WhatsApp** අංකයෙන් මෙම පාඨමාලාවට අදාළ අයදුම් පත්‍රය ලබා ගත හැකිය.

## අයදුම් කරන ආකාරය

- සම්පූර්ණ කරන ලද අයදුම්පත ස්කෑන් කර PDF වශයෙන් **0715226833** දරන **WhatsApp** අංකයකට එවිය යුතුය. එමෙන් ම එම අයදුම්පත 2025/12/14 දින පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන විට රැගෙන ආයුතු ය.
- ජාතික හැඳුනුම්පත සහ අධ්‍යාපන සහතිකවල මුල් සහතික (Original Certificate) සමඟ පැමිණිය යුතුය.

**විමසීම් - පාඨමාලා සම්බන්ධීකාරක - 0715226833/ පාඨමාලා සහායක 0742939904 /**අධ්‍යයන අංශය **- 0112 903731**

**ලේඛකාධිකාරී**

කැලණිය විශ්වවිද්‍යාලය